## මාර්ග සංවර්ධන අධිකාරිය - 2014

මාර්ග සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතේ 16 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං රා ගි ප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං රා ගි ප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං රා ගි ප්‍ර)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලං රා ගි ප්‍ර 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

වටිනාකම රු. 466,561,476 ක් වූ ගෙවිය යුතු කල් බදු කුලී සහ රු. 411,688,613 ක් වූ අවිනිශ්චිත පොලී පිළිවෙලින් ජංගම නොවන වගකීම් හා ජංගම වගකීම් යටතේ වෙනම ගිණුම්ගත කළ යුතුය. කෙසේ වුවද අධිකාරිය විසින් ගෙවිය යුතු මුළු කල්බදු කුලී හා අවිනිශ්චිත පොලී ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**(ආ) ශ්‍රී ලං රා ගි ප්‍ර 7- දේපල, පිරියත හා උපකරණ**

අධිකාරිය විසින් අඛණ්ඩව භාවිතා කරන රු.970,844,975 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 1,887,870 ක් වූ සේවා දායක තැන්පතු ගිණුම් 02 ක හර ශේෂ ගෙවිය යුතු සේවා දායක තැන්පතු ශේෂයන්ට එරෙහිව හිලව් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ කිහිපයක් සඳහා ලැබුණු රු. 6,101,220 ක කුලී අත්තිකාරම් විලම්භිත ආදායම ලෙස ජංගම නොවන වගකීම් යටතේ දක්වනු වෙනුවට ජංගම වගකීම් යටතේ "ණයහිමි" ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ඇ) නියමිත දිනට කොන්ත්‍රාත්තු සම්පූර්ණ කිරීමට නොහැකි වූයේ නම් දඩ මුදල් අය කළ යුතු අතර ඉදිකිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනයේ අංක SBD 01 ප්‍රකාශනයේ 3(49) වගන්තියට අනුව "ප්‍රමාද කළ අලාභ" වලින් ලද ආදායම ලෙස ගිණුම් ගත කළ යුතුය. එසේ වුවද, 2009 සිට 2013 කාලපරිච්ඡේදය තුළ අධිකාරිය විසින් අයකර ජංගම වගකීම් යටතේ දක්වා තිබූ එකතුව රු. 502,465,116 ක් වූ එම දඩ මුදල් 396 ක් ආදායමට මාරු කර නොතිබුණි.

(ඈ) රඳවා ගැනීම් මුදල් ලෙජර ගිණුම් 2 ක එකතුව රු. 5,769,729 ක් වූ හර ශේෂයන් ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් ශේෂයන්ට එරෙහිව හිලව් කර තිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් හා ජංගම වගකීම් යටතේ රඳවාගැනීම් මුදල් පිළිවෙලින් රු.4,060,661,255 ක් සහ රු. 4,405,339,648 ක් ලෙස දක්වා තිබුණද වෙනම සටහනක් හා උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම හා

ජංගම නොවන වගකීම් ලෙස වෙන්කිරීමේ පදනම ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු. 8,466,000,903 ක් වූ රඳවා ගැනීම් මුදල් සත්‍යාපනය කළ නොහැකි බව නිරීක්ෂණය විය.

(ඊ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.මිලියන 1,000 ක්වූ සේවා දායක තැන්පතු සේවා දායක තැන්පතු ගිණුමට බැර කරනු වෙනුවට ලැබිය යුතු ගිණුමට බැර කර තිබුණි. එබැවින්, ජංගම වත්කම්වල හා ජංගම බැරකම්වල ඇතුළත් පිළිවෙලින් ලැබිය යුතු ගිණුම් ශේෂ හා සේවාදායක තැන්පතු ශේෂ රු. මිලියන 1,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) වැඩ පූර්ව අත්තිකාරම් වැඩිපුර අය කිරීම් වලින් උද්ගත වූ රු. 2,332,173 ක බැර ශේෂය ජංගම වත්කම් යටතේ රු. මිලියන 7,144 ක වැඩ පූර්ව අත්තිකාරම් ශේෂයෙහි ඇතුළත් කර තිබූ බැවින් වැඩ පූර්ව අත්තිකාරම් රු. 2,332,173 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) කිලෝ මීටර් 9.32 ක දිගින් යුත් කෙරවළපිටිය සිට කඩවත දක්වා පිටත වටරවුම් මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන් 2014 වර්ෂයේදී ගෙවන ලද රු.182,265,942 ක උපදේශක ගාස්තු 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගොඩනැගිලිවල කෙරීගෙන යන වැඩ ලෙස සාවද්‍යව ගිණුම් ගත කර තිබුණි.

(එ) රු. 32,469,175 ක මුදලක් බැංකු ණය ගිණුමේ ආරම්භක ශේෂයට ගෙන නොතිබුණි. එබැවින් ණය ගිණුම් ශේෂය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනට රු. 107,304,314,019 ක් වූ මුළු බැංකු ණය ශේෂයෙන් රු. 4,147,234,771 ක මුදලක් 2015 වර්ෂයේ බැංකු ණය ගෙවිය යුතු කොටස ලෙස ජංගම වගකීම්වල ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද අධිකාරියෙන් ලද සනාථ කිරීම් අනුව එය රු. 4,220,578,423 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් ජංගම වගකීම් රු. 73,343,652 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් පිළිබඳ විදේශ මූල්‍යායන ව්‍යාපෘතිවලට අයත් රු. 218,960,500 ක් වටිනා මෝටර් වාහන සමාලෝචිත වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කර තිබුණද එම වාහනවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) වටිනාකම රු. 313,208,798 ක් වූ ගොඩනැගිලි ඉදිකරන ලද, ඉඩම්වල වටිනාකම අගය කර ගිණුම්ගත කර නොතිබුණි. මෙම ඉඩම අධිකාරිය ස්ථාපිත කරන ලද අවස්ථාවේදී මහාමාර්ග දෙපාර්තමේන්තුව විසින් මාර්ග සංවර්ධන අධිකාරියට පවරන ලද රජයේ ඉඩමක් විය. කෙසේ වුවද අමාත්‍ය මණ්ඩලය විසින් 2014 ඔක්තෝබර් 30 දිනැති තීරණය මගින් මෙම ඉඩම නිදහස් ප්‍රදානයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට වෙන් කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.

(ක) කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අයත් රු. 20,009,499 ක් වටිනා ස්ථාවර වත්කම් 2014 දෙසැම්බර් 31 වන විට මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කර තිබුණද එම වත්කම්වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ග) එකතුව රු. 3,488,240 ක් වූ විෂයයන් 394 කට අදාළ ස්ථාවර වත්කම් වටිනාකම සහ මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම පිළිබඳ විදේශ මූල්‍යායන ව්‍යාපෘති දෙකක් විසින් මිලදී ගෙන පසුව මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කරන ලද වටිනාකම ලබා ගත නොහැකි විෂයයන් 200 කට අදාළ ස්ථාවර වත්කම් වටිනාකම අගය කර සමාලෝචිත වර්ෂයේදී හෝ මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එබැවින් 2013 හා 2014 වර්ෂ සඳහා ක්ෂය පිළිවෙලින් රු. 348,824 ක් හා රු. 697,648 ක් ගිණුම්වලට අය කර නොතිබුණි.

(ජ) රු.මිලියන 97.51 කට සමාන එජඩො 58,500 කට හා රු.මිලියන 30.13 කට සමාන යූරෝ 135,900 කට මිලදී ගන්නා ලද Multi-Function Network Survey Vehicle (MFNSV) හා Falling Weight Deflectometre(FWD) යන යන්ත්‍ර දෙක මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ට) ස්ථාවර වත්කම් අපහරණයෙන් ලද රු.16,418,233 ක් වූ විකුණුම් මුදල්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ආදායම ලෙස දක්වා තිබුණද එම වත්කම්වල පිරිවැය අධිකාරිය විසින් අත්පත් කරගත් දිනයේ සිට ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ශේෂ හා 2014 දෙසැම්බර් 31 දිනට අදාළ බැංකු විසින් සනාථ කරන ලද ශේෂ අතර රු.3,639,226,411 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද වෙනස්කම් සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ණය ලබාදුන් නියෝජිතායතනය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | බැංකු සනාථ කිරීම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 49,268,963,075 | 49,217,723,859 | 51,239,216 |
| ලංකා බැංකුව | 23,525,258,779 | 20,551,593,117 | 2,973,665,662 |
| මහජන බැංකුව | 12,799,588,721 | 13,413,900,752 | 614,312,031 |
| හැටන් නැෂනල් බැංකුව | 12,176,235,085 | 12,176,244,587 | 9,502 |
| එකතුව | 97,770,045,660 | 95,359,462,315 | 3,639,226,411 |

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මහාමාර්ගවල පිරිවැය හා ව්‍යාපෘති කළමනාකරණ ඒකක 3 ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී පිරිවැය අතර රු.7,016,408,503 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සහ ප්‍රාදේශීය ශාඛා 3 ක බැංකු ශේෂ හා ප්‍රධාන කාර්යාල එක් බැංකු ගිණුමක ශේෂ අතර රු.40,226 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) සේවා දායක තැන්පතු**

සේවා දායකයින් 105 දෙනෙකුට අදාළව රු. 198,474,099 ක්වූ සේවා දායක තැන්පතු වර්ෂ 1 සිට වර්ෂ 6 දක්වා අතර කාලයක් නිරවුල් නොකර පැවතුණු බව නිරීක්ෂණය විය. තවද 2010 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ සේවා දායකයින් 134 කට අදාළව එකතුව රු. 257,057,468 ක්වූ සේවාදායක තැන්පතු එම තැන්පතු ලබාගත් දිනයේ සිටම නොවෙනස්ව පැවතුණි.

**(ආ) අත්තිකාරම් ගෙවීම්**

**(i) ණය කොන්දේසි අත්තිකාරම් (On Account Advance)**

* "මග නැගුම" මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමෙන් අයකරගත යුතු, වර්ෂයකට වැඩි කාලයක් වූ ණය කොන්දේසි අත්තිකාරම් රු. 3,614,943 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කර ගෙන නොතිබුණි.

* වර්ෂයකට වැඩි කාලයක් වූ ගෙවිය යුතු ණය කොන්දේසි අත්තිකාරම් ශේෂයන් එකතුව රු. 10,020,158 ක් නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේදී ද අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

* "මග නැගුම" මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගම සහ "මග නැගුම" උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගමට අදාළව රු.2,377,388 ක්වූ උපචිත වැඩ බිල්පත්‍ර නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

* කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට අදාළව එකතුව රු.24,344,177 ක්වූ බැර ශේෂයන් ණය කොන්දේසි අත්තිකාරම් (On account advances)ලෙස දක්වා තිබූ අතර, ඒවා කොන්ත්‍රාත්කරුවන්ගෙන් වැඩිපුර අයකිරීම් බව නිරීක්ෂණය විය. මෙම මුදල නිරවුල් කිරීම සඳහා 2014 දෙසැම්බර් 31 දක්වා කටයුතු කර නොතිබුණි.

* අදාළ කාර්යය නිම වූ වහාම ලබා ගන්නා ලද අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද 2013 වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට ලබා දෙන ලද රු. 22,046,094 ක් වූ ණය කොන්දේසි අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන් විසින් 2014 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

**(ii) වැඩ පූර්ව අත්තිකාරම්**

* 2014 වර්ෂයේදී දැයට කිරුළ ව්‍යාපෘතිය සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ලබාදෙන ලද රු.මිලියන 2,000 ක් වූ වැඩපූර්ව අත්තිකාරම් අයකර ගැනීම සඳහා 2015 ජුනි දක්වා කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව අනාවරණය විය.

* 2004 සිට 2011 වර්ෂ තුළදී කොන්ත්‍රාත්කරුවන් 21 දෙනෙකුට ලබා දෙන ලද රු. 275,245,398 ක්වූ වැඩපූර්ව අත්තිකාරම් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

* 2013 හා 2014 වර්ෂවලදී දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියට හා මාර්ග අංශ සහාය ව්‍යාපෘතියට ලබා දෙන ලද අත්තිකාරම් පිළිවෙලින් රු. 601,000,000 ක් හා රු. 237,110 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**(iii) මිලදී ගැනුම් අත්තිකාරම්**

සැපයුම්කරුවන්ට දෙන ලද අත්තිකාරම් ඒවා ලබා දෙන ලද කාර්යය නිම වූ වහාම අයකර ගත යුතු වුවද, 2011, 2012 හා 2013 වර්ෂවල හා ඉකුත් වර්ෂ 5 තුළ සැපයුම්කරුවන් 77 දෙනෙකුට ලබා දෙන ලද රු. 17,481,824 ක්වූ මිලදී ගැනුම් අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී ද අය කර ගෙන නොතිබුණි.

**(iv) කොන්ත්‍රාත් අත්තිකාරම්**

සැපයුම්කරුවන්ට හෝ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දෙන අත්තිකාරම් අදාළ කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය තුළදී අය කර ගත යුතු වුවද, 2010 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුළදී හා වර්ෂ 05 කට වැඩි කාලයක් සැපයුම්කරුවන් හෝ කොන්ත්‍රාත්කරුවන් 30 දෙනෙකුට ලබා දෙන ලද රු. 29,108,037 ක්වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී ද අය කර ගෙන නොතිබුණි.

**(ඈ) ණයහිමියන් සහ වෙනත් ගෙවිය යුතු මුදල්**

(i) වර්ෂයකට වැඩි කාලයක් වූ ණයහිමියන් 17 කට, වර්ෂ 2 සිට 5 දක්වා කාලයක් වූ ණයහිමියන් 51 කට හා වර්ෂ 5 කට වැඩි කාලයක් වූ එක් ණයහිමියෙකුට අදාළව පිළිවෙලින් රු. 4,617,450, රු. 14,635,982 ක් හා රු. 1,521,036 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් නොකර පැවතුණු බව නිරීක්ෂණය විය.

(ii) අක්කරෙයිපත්තු අතිරේක පළාත් කාර්යාලයට අදාළව රු. 1,119,113 ක්වූ ඍජු ශ්‍රම වේතන නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) 2009 සිට 2014 වර්ෂවලට අදාළ රු.36,176,000 ක්වූ බදුකුලී අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී ද ගෙවා නොතිබුණි.

**(ඇ) ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල්**

(i) කොන්ත්‍රාත් 774 කට අදාළ රඳවා ගැනීම් මුදල් රු. 620,406,926 ක් වර්ෂ 3 සිට වර්ෂ 10 දක්වා වූ කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(ii) රු. 5,486,278 ක රඳවා ගැනීම් මුදල් වැඩිපුර අය කර ගැනීම් පැවතියද ,ප්‍රමාණවත් තොරතුරු උපලේඛන මඟින් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) උපචිත වියදම් හා ගෙවිය යුතු කොන්ත්‍රාත් ගෙවීම්**

(i) වර්ෂයකට වැඩි කාලයක් පැවති රු. 7,008,077 ක් හා වර්ෂ 2 සිට වර්ෂ 5 දක්වා අතර කාලයක් පැවති රු. 46,913,405 ක්වූ උපචිත වියදම් නිරවුල් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ii) 2012 හා 2013 වර්ෂවලට අදාළව වෙනත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.278,062,288 ක් වූ මුදල් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**(ඊ) කුලී ආදායම හා ලැබිය යුතු කුලී**

මහනුවර උමං මාර්ගයේ සාප්පුවලින් අයකර ගතයුතු රු. 1,622,491 ක් වූ කුලී ආදායම අයකර ගැනීමට වර්ෂ 3කට වැඩි කාලයක් පියවර ගෙන නොතිබුණි.

**(උ) සේවකයින්ගෙන් ලැබිය යුතු වෙනත් මුදල්**

(i) සේවකයින් 66 දෙනෙකුට ලබා දෙන ලද එකතුව රු. 5,655,091 ක් වූ සේවක ණය අය කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) රජයේ ආයතනවල සේවය කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 101 දෙනෙකුට 2014 වර්ෂයට අදාළව ගෙවන ලද එකතුව රු. 696,394,067 ක් වූ පාරිතෝෂික ගෙවීම අධිකාරියට ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි.

(iii) වෙනත් ආයතනවල සේවය කරන මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 94 දෙනෙකුට 2014 වර්ෂයට අදාළව ගෙවන ලද රු. 62,757,658 ක් වූ වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද නොහැකිවී තිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ගෙවීම් වවුචර් හා ජර්නල් වවුචර් විස්තර ආදී සාක්ෂි නොමැතිවීම හේතුවෙන් එකතුව රු. 7,954,777 ක් වූ සේවා දායක තැන්පතු සහ ප්‍රමාද කළ අලාභ විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යෙක්ෂණය කිරීමට නොහැකි විය.

**2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 135, 138 (6) හා 139 (1) | දේශීය බැංකු මූල්‍යායන ව්‍යාපෘතිවල මාර්ග ඉදිකිරීම් වැඩ සඳහා ලබා ගන්නා ලද රු.මිලියන 14,099.3 ක මුදලක් වැය කිරීමේදී බලය දීම, අනුමැතිය දීම, සහතික කිරීම හා ගෙවීම් කිරීමට අදාළව මුදල් රෙගුලාසි විධිවිධාන අධිකාරියේ ව්‍යාපෘති අංශ විසින් අනුගමනය කර නොතිබුණි. ඒ අනුව මාර්ග ඉදිකිරීම් සඳහා මග නැගුම සමාගම්වලට ලබා දෙන ලද රු.මිලියන 6,426 ක් වූ අත්තිකාරම් සඳහා සහතික කරන ලද ලියකියවිලි නොමැතිව වවුචර් සහතික කර ගෙවීම් සිදුකර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | බැංකු ගිණුම් 08 කට අදාළව රු. 5,924,999 ක්වූ කල් ඉකුත් වූ චෙක්පත් 25 ක් අවලංගු කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 373 හා 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 333 දරන කාර්යාල චක්‍රලේඛය | අධිකාරියේ උප කාර්යාල 02 කට හා අංශ 04 කට ලබා දෙන ලද එකතුව රු.1,415,139 ක් වූ සුළු මුදල් අග්‍රිම හා ඉන්ධන අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| (ආ) ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ අංක එස්සීඒ/05 දරන ප්‍රකාශනය | මැනීම් කර හා ගෙවීම් පදනම මත කොන්ත්‍රාත් සඳහා ගෙවීම් සිදු කළ යුතු වුවද, බිල් හා නිම කළ වැඩ මැනීම් සිදු කිරීමෙන් තොරව අවස්ථා 55 කදී එකතුව රු.මිලියන 6,126.37 ක අත්තිකාරම් "මග නැගුම" සමාගම්වලට ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 වගන්තිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව පිළිගත හැකි ඇපකරයක් සහිතව ඕනෑම කොන්ත්‍රාත්තුවක් සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් වැඩ පූර්ව අත්තිකාරම් ලෙස ලබා දිය හැකිය. කෙසේ වුවද එයට පටහැනිව, කිසිදු ඇපකරයක් ලබා ගැනීමෙන් තොරව අධිකාරිය විසින් මග නැඟුම සමාගම්වලට එකතුව රු.මිලියන 6,126.37 ක් වූ අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඈ) | මාර්ග සංවර්ධන අධිකාරියේ 2008 ඔක්තෝබර් 07 දිනැති අංක 294 දරන මුදල් චක්‍රලේඛය | රු.මිලියන 10 ක් දක්වා ගෙවීම් සඳහා පමණක් චෙක්පත් අත්සන් කිරීමට ගණකාධිකාරීට බලය තිබුණද රු.මිලියන 10 කට වැඩි චෙක්පත් ඔහු විසින් අත්සන් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 4,962.68 ක බදු පූර්ව ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා රු.මිලියන 547.17 ක බදු පූර්ව ශුද්ධ අතිරික්තයක් වූ හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 5,509.85 ක පිරිහීමක් දැක්වුණි.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීම සඳහා රු. මිලියන 4,617 කින් මුළු ආදායම අඩුවීම හා රු. මිලියන 892.35 කින් වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන සැලකිය යුතු ශේෂයන් කිහිපයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | 2014 | 2013 |
| | රු.මිලියන | රු.මිලියන |
| ශුද්ධ ජංගම වත්කම් | 2,717 | (76.2) |
| ශුද්ධ වත්කම් | 170,633 | 124,552 |
| සමුච්චිත ඌනතාවය | (13,576) | (8,012) |

ඒ අනුව, 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී ශුද්ධ ජංගම වත්කම් හා ශුද්ධ වත්කම් පිළිවෙලින් සියයට 3665.61 කින් හා සියයට 41 කින් වැඩි වී තිබූ අතර සමුච්චිත ඌනතාවයද සියයට 69 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ජාතික මාර්ග හා පාලම්වල නඩත්තු වැඩ

සමාලෝචිත වර්ෂය සඳහා පාලම් හා ගුවන් පාලම් නඩත්තු කිරීම සම්බන්ධයෙන් අරමුදල් වෙන් කිරීම හා තථ්‍ය වියදම් පහත පරිදි වේ.

| | | වෙන්කිරීම | තථ්‍ය වියදම | උපයෝජනය වෙන්කිරීමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | |
| (i) | සාමාන්‍ය නඩත්තු කිරීම | 1,850 | 2,543.17 | 137.46 |
| (ii) | කාලීන නඩත්තු කිරීම | 3,110 | 2,643.72 | 85.00 |
| (iii) | ජල කානු හා ව්‍යූහ වැඩිදියුණු කිරීම | 940 | 610.22 | 64.91 |
| (iv) | සංඥා ලාම්පු පද්ධති, විථි ලාම්පු, මාර්ග සංඥා හා සලකුණු කිරීම්, නඩත්තු කිරීම සහ සුළු මාර්ග ආරක්ෂණ වැඩිදියුණුකිරීම් | 800 | 575.63 | 71.95 |
| (v) | හදිසි නඩත්තු කිරීම්/ ආපදා වැඩ | 1,280 | 1,421.68 | 111.06 |
| (vi) | තොටුපොළ මෙහෙයුම් හා නඩත්තු කිරීම | 8,000 | 7,801.85 | 97.52 |
| | එකතුව | 15,980 | 15,596.27 | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ලේඛනය මඟින්, මාර්ග 186 ක නඩත්තු කාර්යයන් සඳහා රු.මිලියන 493.83 ක මුදලක් ලබා දී තිබුණද වර්ෂය ඇතුළත එම මාර්ග නඩත්තු කර නොතිබුණි.

(ii) අයවැය මඟින් ප්‍රතිපාදනය කර නොමැති හා වාර්ෂික නඩත්තු වැඩසටහනේ ඇතුළත් කර නොමැති මාර්ග නඩත්තු වැඩ 07 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 26.31 ක මුදලක් පළාත් අධ්‍යක්ෂ කාර්යාල 05ක් විසින් වැය කර තිබුණි.

(iii) මාර්ග සංවර්ධන අධිකාරියට අදාළ නොවන මාර්ග නඩත්තු වැඩ සඳහා 2014 වර්ෂයේ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. කෙසේ වුවද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග 281 ක් පිළිබඳව සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 1,248.14 ක මුදලක් වැය කර තිබුණි.

(iv) වර්ෂය තුළදී අපේක්ෂා කළ යුතු නඩත්තු කාර්යයන් හා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග නඩත්තු වැඩ මත දරන ලද පිරිවැය ආදිය විධිමත්ව හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත කාර්ය සාධනය ඉටු කර ගත නොහැකි වීම නිසා වාර්ෂික නඩත්තු වැඩසටහන 2014 ජූනි 30 දින නැවත සංශෝධනය කිරීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය.

**4.1.2 ඉංජිනේරු සේවා හා පාලම් සැලසුම් අංශයේ කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉහල මට්ටමේ කළමනාකරණය විසින් මෙම අංශයේ වැඩ සැලැස්ම අනුමත කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබූ අතර, වර්ෂය ආරම්භයට පෙර එය පිළියෙල කර නොතිබුණි. මේ අතර වැඩ සැලැස්ම 2014 නොවැම්බර් මාසයේදී නැවත සංශෝධනය කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ පාලම් 142 ක් ඉදිකිරීම සඳහා යෝජනා කර තිබූ නමුත් 2014 දෙසැම්බර් මාසයේදි ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව පාලම් 84 කට අදාළ සැලසුම් අවසන් කර තිබුණි. තවද, පාලම් 06 කට අදාළ ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා වැඩ සැලැස්මට බාහිරව පාලම් 27 ක් සැලසුම් කර තිබූ අතර ඉන් පාලම් 07 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාලම් නොවිය.

**4.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**4.2.1 මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම**

රජයේ අරමුදල් යටතේ මාර්ග පුළුල් කිරීම් සහ වැඩි දියුණු කිරීම සඳහා වෙන් කිරීම් හා කාර්යසාධන වාර්තා, ක්‍රියාකාරී සැලැස්ම හා පළාත් අධ්‍යක්ෂවරුන් විසින් එවන ලද ප්‍රගති වාර්තා අනුව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 16,238 ක් වටිනා මාර්ග 141 ක් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම ආරම්භ කිරීම සඳහා ඉලක්ක කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් කිසිදු ඉදිකිරීමක් සහ වැඩි දියුණු කිරීමක් ආරම්භ කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබූ මාර්ග 33 ක් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා 2014 වර්ෂය තුළදී රු.මිලියන 2,757 ක මුදලක් වැය කර තිබුණි. මේ අතර මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග 900 ක් සඳහා රු.මිලියන 38,519 ක මුදලක් වැය කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 5,319 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත මාර්ග 61 ක් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම 2014 දෙසැම්බර් 31 දිනට සියයට 50 කට අඩු ප්‍රගතියක් දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 16,503 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග 234 ක් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම 2014 දෙසැම්බර් 31 දිනට සියයට 50 කට අඩු ප්‍රගතියක් දක්වා තිබුණි.

**(ආ) දේශීය බැංකු විසින් මූල්‍යායනය කෙරෙන මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (LBFP)**

දිවයින පුරා කිලෝ මීටර 1,433.85 ක දිගින් යුත් ප්‍රමුඛතා මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකුවලින් රු.බිලියන 151.77 ක් වූ ණය මුදල් ලබා ගැනීමට මාර්ග සංවර්ධන

අධිකාරියට අවසර ලැබී තිබුණි. ඒ අනුව මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු.බිලියන 137.52 ක් වටිනා කොන්ත්‍රාත්, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාදී තිබුණි. මාර්ග ඉදිකිරීම් සඳහා වූ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම සඳහා 2012, 2013 හා 2014 වර්ෂවලදී දේශීය බැංකු 07 කින් එකතුව රු.මිලියන 108,257.66 ක් වූ ණය මුදල් අධිකාරිය විසින් ලබාගෙන තිබුණි. ඉන් රු.මිලියන 953.35 ක මුදලක් 2014 වර්ෂය තුළදී නිරවුල් කර තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට ණය මුදලේ ගෙවිය යුතු කොටස රු.මිලියන 107,304.31 ක් බව නිරීක්ෂණය විය. ලැබුණු ණය පිළිබඳ විස්තර හා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ණය මුදල් කොටස පිළිබඳ විස්තර පහත දැක්වේ.

| බැංකුවේ නම | වර්ෂය සඳහා බැංකු වලින් ලැබුණු ණය | | | 2014 වර්ෂය තුළ ප්‍රාග්ධනය ආපසු ගෙවීම | 2014 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| කොමර්ෂල් බැංකුව | 1,267 | 634 | 2,647 | 128 | 4,420 |
| ලංකා බැංකුව | 3,703 | 9,637 | 10,402 | 218 | 23,525 |
| මහජන බැංකුව | 3,369 | 5,234 | 4,806 | 607 | 12,800 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 384 | 4,953 | 43,931 | - | 49,268 |
| සංවර්ධන මූල්‍ය සංස්ථාව | 209 | 724 | * (32) | - | 901 |
| හැටන් නැෂනල් බැංකුව | - | 3,614 | 8,562 | - | 12,176 |
| ජාතික සංවර්ධන බැංකුව | - | - | 4,214 | - | 4,214 |
| | 8,932 | 24,796 | 74,530 | 953 | 107,304 |

* 2013 වර්ෂයේදී සාවද්‍යව බැරකර 2014 වර්ෂයේදී නිවැරදි කර ඇත.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලබාගත හැකි වූ තොරතුරු අනුව ඉහත ව්‍යාපෘතිය (LBFP) යටතේ මාර්ග ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව තෝරාගෙන නොතිබුණි. ඒ වෙනුවට අදාළ මාර්ග සඳහා කොන්ත්‍රාත් යෝජනා කොන්ත්‍රාත්කරුවන් විසින්ම රැගෙන විත් තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරුවන්ගේ යෝජනා තාක්ෂණික ඇගැයීම් කමිටුව (TEC) විසින් විධිමත්ව ඇගයීම් කර නොතිබුණි. තවද එක් එක් මාර්ගය ඇගයීම් කිරීම සඳහා වැඩ විෂයයන්, ප්‍රමාණයන් හා රේටයන් ඇතුළත් ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. එබැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මහාමාර්ග සම්මත රේටය (Highway Standard Rate) යොදා ගනිමින් කොන්ත්‍රාත්කරුවන්ගේ යෝජනා ඇගයීම් කර තිබුණි. කෙසේ වුවද ප්‍රමාණ පත්‍රවල (BOQ) කොන්ත්‍රාත්කරුවන් විසින් යෝජනා කරන ලද රේටයන් ඉංජිනේරු

රේටයට සාපේක්ෂව ඉතා වැඩි වී තිබූ අතර කොන්ත්‍රාත්කරුගෙන් කොන්ත්‍රාත්කරුට රේටයන් වෙනස් වී තිබුණි.

(iii) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සම්මත ප්‍රසම්පාදන කමිටුව (SCAPC) විසින් එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා අවසාන කොන්ත්‍රාත් මුදල තීරණය කර නිර්දේශ කර තිබුණි. ඒ අනුව තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් කොන්ත්‍රාත් 54 ක් සඳහා නිර්දේශ කරන ලද රු.මිලියන 146,552.78 ක මුදල අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සම්මත ප්‍රසම්පාදන කමිටුව විසින් රු.මිලියන 155,794.94 ක් දක්වා වැඩි කර තිබුණි. එබැවින් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සම්මත ප්‍රසම්පාදන කමිටුව විසින් මාර්ග ඉදිකිරීම් සඳහා රු.මිලියන 9,242.16 ක අතිරේක පිරිවැයක් නිර්දේශ කර තිබුණි.

(iv) අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව, දේශීය බැංකු මූල්‍යායන ව්‍යාපෘතිය යටතේ සියලු ඉදිකිරීම් දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතාවය වැඩි කිරීමේ අරමුණින් දේශීය කොන්ත්‍රාත්කරුවන් මගින් සිදුකළ යුතුය. කෙසේ වුවද සුළු කොන්ත්‍රාත්කරුවන් පිරිසකට අනිකුත් කොන්ත්‍රාත්කරුවන්ට වඩා කොන්ත්‍රාත් දීම හේතුවෙන් මෙම අරමුණ සතුටුදායක ලෙස ඉටුකර ගත නොහැකි වී තිබුණි.

(v) 2012 වර්ෂයේ මුල් භාගයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඇස්ෆෝල්ට් අතුරන ලද මාර්ගයක කොටසක් දේශීය බැංකු මූල්‍යායන ව්‍යාපෘතිය යටතේ නැවත පුනරුත්ථාපනය කිරීම සඳහා ඇතුළත් කර තිබුණු බව අනාවරණය විය.

(vi) මාර්ග 28 ක් ඉදිකිරීමට රු.මිලියන 55,392.2 ක ණය මුදලක් ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් දේශීය බැංකු මූල්‍යායන ව්‍යාපෘතියට අනුමැතිය ලැබී තිබුණි. ලබාගත් ණය මුදලින් ව්‍යාපෘති කාර්යයන්ට කිසිදු සම්බන්ධතාවයක් නොමැති මාර්ග සංවර්ධන අධිකාරියේ වෙනත් කාර්යයන් සඳහා රු.මිලියන 28,000 ක මුදලක් වැය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| | මුදල<br>---------<br>රු.මිලියන |
|---|---:|
| අමාත්‍යාංශයට ලබාදුන් අරමුදල් | 3,741 |
| ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය | 105 |
| මහ නැගුම සමාගම් | 5,824 |
| ගෙවීම් ඒකකය | 282 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් | 30 |
| මාර්ග නඩත්තු භාර අරමුදල් ගෙවීම | 358 |
| ඇස්ෆෝල්ට් පිරියත | 2,374 |
| පළාත් අධ්‍යක්ෂ කාර්යාලය | 3,631 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 6,140 |
| CIGFL | 16 |
| ව්‍යාපෘති අංශයේ පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් වැඩ | 5,499 |
| එකතුව | 28,000 |

තවද, රු.මිලියන 55,392.2 ක් වූ මාර්ග 28 ක් සඳහා අනුමත කරන ලද ණය මුදල් වලින් රු.මිලියන 21,238.98 ක මුදලක් අත්තිකාරම් ලෙස හා වැඩ නිම කිරීම් සඳහා ගෙවා තිබුණි. ඒ අනුව ලබාගත් ණය මුදලින් කළ යුතු ඉතිරි වැඩ සඳහා ගෙවිය යුතු මුදල රු.මිලියන 34,153.34 ක් විය. එහෙත් ඒ හැර ව්‍යාපෘතියේ කාර්යයන් නොවන කාර්යයන් සඳහා 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 28,000 ක මුදලක් යොදාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස

ලබාගත හැකි ණය ශේෂය රු.මිලියන 6,153.34 ක් විය. ඒ අනුව කළයුතු ඉතිරි මාර්ග වැඩ සඳහා ගෙවීම් කිරීමේදී අනාගතයේදී මූල්‍ය ගැටලු ඇති විය හැකි බවත් එය ඉදිකිරීම් වැඩවලට අහිතකර ලෙස බලපෑ හැකි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(vii) පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනගම මාර්ගය පුනරුත්ථාපනය කිරීම සඳහා ඉහත ව්‍යාපෘතිය යටතේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රු.මිලියන 2,172 ක ණය මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාගෙන තිබුණි. මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 15 කට සමාන වන රු.මිලියන 315 ක් වටිනා ඉදිකිරීම් වැඩ සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරු විසින් නිම කර තිබුණද 2014 දෙසැම්බර් 31 දින ණය මුදලින් සියයට 96 කට සමාන රු.මිලියන 2,096 ක මුදලක් අධිකාරිය විසින් වියපැහැදම් කර තිබුණි. කෙසේ වුවද වැඩ පූර්ව අත්තිකාරම් ඇතුළත් රු.මිලියන 596 ක මුදලක් පමණක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

- * 2014 නොවැම්බර් මාසය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද අතුරු ගෙවීම් සහතික අංක 04 අනුව, ඉහත මාර්ගය සඳහා විචලන නියෝග අංක 01 ලෙස රු.මිලියන 18.45 ක මුදලක් ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද ඇඹිලිපිටිය පිහිටි ජනාධිපති මන්දිරයට අදාළ ඉදිකිරීම් පිරිවැය සඳහා කොන්ත්‍රාත්කරු විසින් මෙම විචලනය ඉදිරිපත් කර තිබුණි.

- * අතුරු ගෙවීම් සහතික අංක 04 යටතේ ඉහත කාලපරිච්ඡේදය සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 142.6 ක් වටිනා විචලන නියෝග අංක 02 ඉදිරිපත් කර තිබුණද, කිලෝමීටර් 9.21 ක දිගින් යුත් වෙනත් මාර්ග 17 කට අදාළ ඉදිකිරීම් වැඩ හේතුවෙන් මෙම මුදල පැන නැඟී තිබුණි.

**(ඈ) ව්‍යාපෘති කළමනාකරණ ඒකක සඳහා ලබාදී තිබූ අරමුදල්**

(i) සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණය අරමුදල්වලින් මාර්ග හා පාලම් ඉදිකිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකක 21 කට රු.මිලියන 5,820 ක මුදලක් ලබාදී තිබුණද, ව්‍යාපෘති කාර්යයන් සඳහා රු.මිලියන 3,006 ක් පමණක් වැය කර තිබුණි. ඉතිරි රු.මිලියන 2,814 ක මුදල පිළිවෙලින් ඍජු වියදම්, ව්‍යාපෘති කාර්යාලය සඳහා නඩත්තු වියදම් හා පරිබාහිර වියදම් ලෙස වැයකර තිබුණි.

(ii) ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදෙන ලද රු.මිලියන 20 ක් වැය කළ ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ව්‍යාපෘති 22 ක් සඳහා ලබාදී තිබූ දේශීය බැංකු ණය අරමුදල් වටිනාකම රු.මිලියන 6,140.11 ක් විය. එම ව්‍යාපෘතිවලට අදාළව 2014 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු වූ ප්‍රතිපාදනය රු.මිලියන 19,304 ක් විය. කෙසේ වුවද රු.මිලියන 8,467 ක මුදලක් පමණක් ලබාගෙන තිබුණි.

**(ඇ) අධිකාරියේ ව්‍යාපෘති අංශය සඳහා ලබා දෙන ලද අරමුදල්**

(i) අධිකාරියට අදාළ වන එහෙත් දේශීය බැංකු මූල්‍යයන ව්‍යාපෘතියට අයත් නොවන මාර්ග පුළුල් කිරීම්/ වැඩිදියුණු කිරීම්/ ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ අවස්ථා 697 කදී රු.මිලියන 5,499.43 ක මුදලක් අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් වැය කර තිබුණි.

(ii) මාර්ග සංවර්ධන අධිකාරිය හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව අතර එළඹී ණය ගිවිසුම අනුව, මාර්ග ව්‍යාපෘති 28 ක් සඳහා 2014 දෙසැම්බර් 31 දිනට ලබාගත හැකි ණය මුදල රු.මිලියන

34,200.79 ක් විය. කෙසේ වුවද මෙයට පටහැනිව, මෙම අරමුණු සඳහා රු.මිලියන 49,238.98 ක් හෝ අතිරේකව රු.මිලියන 15,038.18 ක් ලබා ගෙන තිබුණි.

(iii) දේශීය බැංකු මූල්‍යායන ව්‍යාපෘති කාර්යයන්ට අදාළ නොවන වැඩ සඳහා රු.මිලියන 28,000 ක ණය මුදල් ලබාගෙන තිබූ අතර ඒ සඳහා ගෙවන ලද පොලිය රු.මිලියන 466.08 ක් විය.

**(ඉ) ගලිගමුව - රුවන්වැල්ල - කරවනැල්ල මාර්ගය ඉදිකිරීම**

ගලිගමුව - රුවන්වැල්ල - කරවනැල්ල දක්වා විහිදෙන මාර්ගයේ (කි.මී.000+0 සිට කි.මී.210+29 දක්වා) ඇස්පෝල්ට් ඇතිරීම මඟින් ප්‍රතිසංස්කරණය කිරීම රු.මිලියන 2,472 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව, ඉදිකිරීම් වැඩ 2012 ජනවාරි 14 දින ආරම්භ කර 2014 ජුලි 14 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. 2014 දෙසැම්බර් 17 දින සිදු කරන ලද පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය යෝජනාව රු.මිලියන 2,602.48 ක් වූ අතර තාක්ෂණ ඇගයීම් කමිටුවේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 2,328.27 ක් විය. ඒ අනුව ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 144.09 කින් ඉක්මවමින් රු.මිලියන 2,472.36 ක වටිනාකමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

- මෙම මාර්ගයේ සිදු කළ යුතු වැඩ, ප්‍රමාණයන් හා රේටයන් ඇතුළත් ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හා ඒ අනුව කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය යෝජනා ඇගයීම් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය යෝජනාව සිදු කළ යුතු වැඩ ප්‍රමාණයන් හා රේටයන්ගෙන් සමන්විත වී නොතිබුණි. කෙසේ වුවද ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත්තුවේ පිරිවැය පමණක් ඇගයීම් කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ අතුරු ගෙවීම් සහතික අංක 23 අනුව, වැඩ විෂයයන්ගේ ප්‍රමාණ පත්‍ර වටිනාකමට වැඩියෙන් රු.මිලියන 439 කින්, අතිරික්ත ගෙවිය යුතු වටිනාකමක් දක්වා තිබුණි.

- වැඩ විෂයයන්, ප්‍රමාණයන් හා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රමාණ පත්‍ර මත පදනම් වූ මිල රේටයන් ඇගයීම් කිරීමෙන් තොරව තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් කොන්ත්‍රාත් මුදල පමණක් ඇගයීම් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද අතුරු ගෙවීම් සහතිකයේ ඇතුළත් පස්වැඩ, පාලම් හා කාණු ඇතුළත් වැඩ විෂයයන් සඳහා ප්‍රමාණ පත්‍ර වටිනාකමට වඩා රු.මිලියන 439.49 ක වැඩියෙන් ගෙවිය යුතු මුදලක් නිරීක්ෂණය විය. මෙම හේතුව නිසා ප්‍රමාණපත්‍රවල දක්වා ඇති වෙනත් වැඩවල අඩුවීමක් නිරීක්ෂණය විය.

- පස් සේදී යාම වළක්වා ගැනීමට පැති බැමි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාණ පත්‍රයන්හි වෙන්කර නොතිබුණි. කෙසේ වුවද මෙම මාර්ගයේ ස්ථාන 87 ක මීටර් 1763 කට විහිදෙන පැති බැමි ඉදිකිරීම සඳහා අවශ්‍යතාවය හඳුනා ගෙන තිබුණි.

- මෙම මාර්ගයේ එක් පාලමක් පමණක් ඉදිකිරීම සඳහා කටයුතු කර තිබුණි. පාලම් 5 ක් අබලන් තත්ත්වයේ පවතින බවත්, එම පාලම් ප්‍රතිසංස්කරණය කළ යුතු බවත්, වෙනත් පාලම් 2 ක් මාර්ගයට සුදුසු පරිදි පුළුල් කළ යුතු බවත් ඉංජිනේරු කාර්යාලය විසින් හඳුනා ගෙන තිබුණි.

**(ඊ) නෝවුඩ් අප්කෝට් මාර්ගයේ අංක 9/12 පාලම ඉදිකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නෝවුඩ් අප්කෝට් මාර්ගයේ අංක 9/12 පාලම ඉදිකිරීම සඳහා රු.3,456,682 ක මුදලකට කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. පාලමේ පළල මීටර් 4 සිට මීටර් 7 දක්වා වැඩි කිරීම හේතුවෙන් නව කොන්ත්‍රාත් වටිනාකම රු.8,162,377 ක් විය. ඉදිකිරීම් වැඩ සඳහා

රු.3,425,378 ක මුදලක් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු වැඩ බිම හැර දමා ගොස් තිබුණි. කාර්ය සාධන බැඳුම්කරය අවලංගු කර තිබූ හෙයින්, කොන්ත්‍රාත්කරුට ගෙවන ලද ගෙවීම් අයකර ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියට නොහැකි වී තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) පාලමේ මතුපිට කොටසක පමණක් කොන්ක්‍රීට් තට්ටුව ඇතිරීම සිදු කර තිබුණි. එබැවින් පාලමේ අනිත් කොටස ප්‍රමාණවත්ව ආවරණය කර නොතිබූ බැවින් හා අනතුරු ඇඟවීම් සංඥා සවිකර නොතිබූ බැවින් අනතුරු සඳහා විශාල අවදානමක් ඇති වී තිබුණි.

(iii) පාලම ඉදිකිරීම් 2010 ඔක්තෝබර් 26 දින ආරම්භ කිරීමටත්, 2011 මාර්තු 25 ට පෙර අවසන් කිරීමටත් යෝජනා කර තිබුණද, ඉදිකිරීම 2014 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**( උ) විජේබාහුකන්ද පාලම ඉදිකිරීම**

(i) පාලම ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.30,833,502 ක්ව තිබියදී ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 25.32 කින් අඩු වූ රු.23,907,253 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කාලීන මිල සැලකිල්ලට ගැනීම මඟින් ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණේ නම් කොන්ත්‍රාත් මිල ප්‍රමාණාත්මකව අඩු කිරීම මඟින් අපේක්ෂිත කාර්ය සාධනයක් හෝ ඉදිකිරීමෙහි නිශ්චිත ගුණාත්මකභාවයක් අපේක්ෂා කළ නොහැකි බව නිරීක්ෂණය විය. එබැවින් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේ නිරවද්‍යතාවය ප්‍රශ්නගත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) පාලම ඉදිකිරීම් වැඩ 2011 අප්‍රේල් 04 දින ආරම්භ කිරීමටත් 2012 ජනවාරි 09 ට පෙර නිම කිරීමටත් යෝජනා කර තිබුණි. 2012 සැප්තැම්බර් 02 දක්වා කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමක්ද ලබා දී තිබුණි. 2014 දෙසැම්බර් 15 දක්වා ඉදිකිරීම් නිම කර නොතිබුණද කාලය දීර්ඝ කිරීම හෝ ප්‍රමාද කළ අලාභ අය කිරීම සිදු කර නොතිබුණි.

(iii) අවස්ථා 02 කදී අතිරේක වැඩ හේතුවෙන් රු.11,992,423 කින් හෝ සියයට 50 කින් කොන්ත්‍රාත් වටිනාකම වැඩි කර තිබුණි.

(iv) පාලම ඉදි කර තිබුණද එක් පැත්තක හෝ මාර්ග මේ දක්වා ඉදිකර නොතිබුණි. තවද පාලමේ ආරක්ෂව සඳහා එයට ඇතුල්වන ස්ථානයේ " වින්ග් වෝල්ස්" (wing walls) ඉදි කළ යුතුය.

(v) පාලමට අනුබලදෙන (abetment) හා යට (pears) අතුරන ලද කොන්ක්‍රීට්වල විශාල වශයෙන් මී වද බෙණ දැකිය හැකි විය. ස්ථාන කිහිපයක තලාඳ වලට (Beam) යොදා ඇති යකඩ බාර් මතුපිටට පැමිණ තිබුණි. පාලමේ පිටවීම් ස්ථානයේ දකුණු පැත්තේ " වින්ග් වෝල්" යට පස් බාදනය වී තිබුණි.

**4.2.2 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වානේ පාලම් ඉදිකිරීම**

එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ වානේ පාලම් 10 ක් රු.3,831,936,290 ක මුදලක් වැය කර ඉදි කර තිබුණි. ඉන් රු.336,328,087 ක මුදලක් ලංකා පටුන පාලම හා පාල තෝප්පූර් - සේරුවිල පාලම ඉදිකිරීම සඳහා දරා තිබූ අතර රු.3,495,608,203 ක මුදලක් නගරයට ඇතින් සම්බන්ධවන මඩකලපුව - තිරුක්කොන්ඩයි ආරු - ත්‍රිකුණාමලය (A -15) මාර්ගයේ හා අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය (A-6) මාර්ගයේ පාලම් 08 ක් ඉදිකිරීම සඳහා දරා තිබුණි. 2009 හා 2010 වර්ෂ තුළදී රු.මිලියන 3,495.6 ක් දරමින් ත්‍රිකුණාමලයේ පිටත වටරවුම් මාර්ගයේ පාලම් 08 ක් ඉදි කර තිබුණද, වාහන ගමනාගමනයට හැකිවන පරිදි මෙම පාලම්වලට සම්බන්ධවන මාර්ග වර්ෂ 4 ක් ඉක්ම ගොස් තිබියදීත් නිම කර නොතිබුණි.

**4.2.3 කතරගම සංචාරක නිවාසය ඉදිකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කතරගම සංචාරක නිවාසයේ බිම් මාලය ඉදිකිරීමේ වැඩ 2010 සැප්තැම්බර් 28 දින රු.12,352,242 කට කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණු අතර කොන්ත්‍රාත්කරු වෙත රු.11,771,448 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුම අනුව 2011 ජුනි 07 දිනට පෙර වැඩ නිම කිරීමට එකඟ වී තිබුණි. කෙසේ වුවද ඉදිකිරීම් වැඩ 2014 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන ලද වැඩවල සැලකිය යුතු අඩුපාඩු තිබුණද, එම අඩුපාඩු පිළිබඳ සැලකීමෙන් තොරව පළමු මහලේ ඉදිකිරීමද 2014 දෙසැම්බර් 24 දින රු.7,922,316 කට ඔහුටම පවරා තිබුණි.

**4.4 නිෂ්ඵල ගනුදෙනු**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2009 නොවැම්බර් 19 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය අනුව, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ ඉඩම බදු ගැනීමට අදාළව නාගරික සංවර්ධන අධිකාරියට රු.1,000 ක වාර්ෂික බදු කුලියක් ගෙවිය යුතු විය. කෙසේ වුවද 2008 අගෝස්තු 20 දින නාගරික සංවර්ධන අධිකාරිය සමඟ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්සන් කරන ලද බදු ගිවිසුමේ විධිවිධානවලට අනුව වර්ෂ 50 කට වැඩි කාලයක් සඳහා වාර්ෂික බදු කුලිය රු.මිලියන 6 ක් ලෙස තීරණය කර තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි වාර්ෂික බදු කුලී ගෙවීම අඩු කිරීමට හැකිවන පරිදි බදු කුලී ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) මූලික ගෙවීම වෙනුවට රු.466,561,476 ක් වූ බදුකුලී ගෙවා නොතිබුණද, බදු කුලී සඳහා 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා තිබුණි. බදු කුලී ගිවිසුමේ සලසා තිබූ විධිවිධානවලට අනුව, හිඟ ශේෂයන්ට වඩා දඩ මුදල් පනවනු ලැබේ. එබැවින් හිඟ බදු කුලී වෙනුවෙන් එකතුව රු.29,839,114 ක් වූ දඩ මුදල් අයකරනු ඇත.

(iii) විදේශ මූල්‍යයන ව්‍යාපෘතියක අරමුදල් යොදා ගනිමින් ඉදිකරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය 2014 නොවැම්බර් 21 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. කෙසේ වුවද මාර්ග සංවර්ධන අධිකාරිය නව ගොඩනැගිල්ලට මාරු කර නොතිබූ අතර 2014 දෙසැම්බර් සිට 2015 මාර්තු දක්වා රු.40,697,802 ක් වූ ගොඩනැගිලි කුලී බාහිර ආයතනයකට ගෙවා තිබුණි. තවද නව ගොඩනැගිල්ල 2015 ජුනි වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(iv) 2006 සිට 2015 දක්වා වර්ෂ තුළ ව්‍යාපෘති 50 ක් ආරම්භ කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද ඉදිකිරීම් වැඩ ප්‍රමාද වීම, දුර්වල කාර්ය සාධනය, අරමුදල් හිඟවීම, මාර්ග සංවර්ධන අධිකාරියේ නොවන වැඩ අවසන් කිරීම ආදිය හේතුවෙන් මෙම ව්‍යාපෘති අතරමඟ නතර වී තිබුණි. මෙම ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 5,891.05 ක් වූ අතර රු.මිලියන 705.39 ක මුදලක් දැනටමත් ගෙවා තිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) චලනය නොවන වත්කම්**

(i) වටිනාකම රු.31,810,655 ක් වූ උපයෝජනය නොකළ හා සෙමින් චලනය වන අමතර කොටස් තොගය වර්ෂයකට වැඩි කාලයක් ගබඩාවල පැවතුණි.

(ii) රු.1,989,955 ක් වූ යල් පැනගිය නිල ඇඳුම්, සපත්තු හා සැන්ඩල්ස්, ටයර් හා ද්‍රව්‍ය තොගය - ඇස්පෝල්ට් පිරියත අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2008 හා 2009 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබුණි.

**4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පුද්ගලික සමාගම් සමඟ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද සමහර ගනුදෙනු මතභේදාත්මක විය. එම ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(i) මහ නැඟුම සමාගම්වලින් ලැබිය යුතු මුදල්**

* 2012 පෙබරවාරි 10 දින මහ නැඟුම සමාගම් සමඟ එළඹී ගිවිසුම් අනුව එම සමාගම් සඳහා කුලියට දෙන ලද වාහනවල කුලී ප්‍රමාදයකින් තොරව අයකර ගත යුතු වුවද 2008 සිට 2013 කාලපරිච්ඡේදය සඳහා අධිකාරියට ලැබිය යුතු රු.488,868,233 ක කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

* මහ නැඟුම සමාගම්වලට කුලියට දෙන ලද යල් පැනගිය වාහන 20 ක් ආපසු භාරදී නොතිබූ බව නිරීක්ෂණය විය.

* වත්කම්, පාරිභෝගික ද්‍රව්‍ය හා අමතර කොටස් මිලදී ගැනීම සඳහා 2004 සිට 2007 දක්වා කාලපරිච්ඡේදය තුළ මහ නැඟුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමට ලබාදුන් රු.63,276,545 ක් හා රු.7,536,165 ක් වූ අයවිය යුතු මුදල එම සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) **මහ නැඟුම සමාගම්වලට ගෙවිය යුතු මුදල්**

2014 දෙසැම්බර් 31 දිනට මහ නැඟුම සමාගම් තුනකට ගෙවිය යුතු මුදල් රු.225,297,655 ක් වූ අතර ඉන් රු.9,993,329 ක් 2013 වර්ෂයට අදාළ විය. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හෝ ලැබිය යුතු ශේෂවලට හිලව් කිරීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.7 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) සේවක සංඛ්‍යාව**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2014 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවක සංඛ්‍යා තත්ත්වය අනුව, තනතුරු 11 ක පුරප්පාඩු 711 ක් හා වෙනත් තනතුරු 07 ක අතිරික්ත 1400 ක් පැවති බව අනාවරණය විය.

(ii) මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ තාක්ෂණික සේවයේ තනතුරු 148 ක සහ ලිපිකරු හා සමාන්තර සේවාවල තනතුරු 47 ක පුරප්පාඩු පැවති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මාර්ග සංවර්ධන

අධිකාරියේ කාර්ය සාධනය කෙරෙහි අහිතකරව බලපා ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

**(ආ) වෙනත් ආයතන සඳහා ලබා දුන් අධිකාරියේ සම්පත්**

(i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 8.3.9 වගන්තිය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් කිසිදු රාජ්‍ය ආයතනයක් වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසායයක් විසින් වියදම් දැරීම හෝ එහි සම්පත් යෙදවීම (මානව සම්පත් ඇතුළත්ව) සඳහා අවසර ලබා දී නොමැත. කෙසේ වුවද මෙයට පටහැනිව අධිකාරිය විසින් එහි කාර්ය මණ්ඩලයේ 114 දෙනෙකු වෙනත් ආයතනවලට මුදා හැර තිබූ අතර පසුව එම සේවකයන් සමාලෝචිත වර්ෂය තුළදී නැවත මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත කර තිබුණි.

(ii) වෙනත් ආයතන 7 කට මුදා හැර තිබූ මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් 7 දෙනෙකුට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.2,683,222 ක් වූ වැටුප් ගෙවා තිබූ අතර මෙම වැටුප් ලැබිය යුතු මුදල් ලෙස ණයගැති ගිණුමේ දක්වා තිබුණි. මෙයින් රු.2,053,066 ක මුදලක් 2014 වර්ෂය සඳහා හා රු.630,156 ක මුදලක් 2013 වර්ෂය සඳහා අදාළ වන බව නිරීක්ෂණය විය.

**(ඇ) ප්‍රසම්පාදන අංශයේ කාර්යසාධනය**

(i) මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදනයන් විධිමත් හා කාර්යක්ෂම ආකාරයෙන් සිදු කිරීමේ අරමුණ සහිතව ප්‍රසම්පාදන අංශය පිහිටුවා තිබුණි. එහෙත් ප්‍රසම්පාදන අංශයේ කාර්යයන් වර්ෂ කිහිපයක් තුළ ක්‍රමයෙන් අඩු වී තිබුණි.

(ii) එම අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 37 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 16 ක් වූ අතර, එම අංශයේ නිලධාරීන් වූයේ අධ්‍යක්ෂ සහ සැපයුම් නිලධාරී පමණක් විය.

(iv) රු.මිලියන 24.67 ක් වූ ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනයන් පමණක් ප්‍රසම්පාදන අංශයෙන් සිදු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ වෙනත් ප්‍රසම්පාදනයන් වෙනත් අංශ මඟින් සිදු කර තිබුණි.

**(ඈ) සැලසුම් අංශය**

(i) සැලසුම් අංශයේ සංවිධාන ව්‍යුහයට අනුව එම අංශයේ සේවක අවශ්‍යතාවය 117 ක් විය. කෙසේ වුවද පවත්නා කාර්ය මණ්ඩලයේ සේවකයන් 81 ක් පමණක් වූ අතර ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 36 ක් පැවතුණි.

(ii) සැලසුම් අංශයේ සංවිධාන ව්‍යුහයට අනුව යෝජිත 117 ක් වූ සේවක සංඛ්‍යාව පරිපාලන අංශයේ යෝජිත සේවක සංඛ්‍යාවට ගැලපී නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

(අ) 2003 ජුනි 02 දිනැති "යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශ" අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.1.3 ඡේදයට අනුව, සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 ට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද 2014 – 2018 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ 2015 ජනවාරි 01 දිනදීය.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව මානව සම්පත් අයවැය ආකෘතියකට ඒකාබද්ධව එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවයන් සංයුක්ත සැලැස්මේ අන්තර්ගත කළ යුතු වුවද 2014 – 2018 දක්වා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ හෝ 2014 වර්ෂය සඳහා අධිකාරියේ අයවැය ලේඛනයේ සේවක සංඛ්‍යා විස්තර ඒ අනුව සපයා නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

(i) සමාලෝචිත වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ නැවත සංශෝධිත අයවැය ලේඛනය 2015 පෙබරවාරි 25 දින විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද සංශෝධිත අයවැය ලේඛනයට අනුරූප වන පරිදි මාර්ග සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2014 මුදල් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පිළියෙල කරන ලද කාර්ය සාධන වාර්තාව අධිකාරියේ පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට 2015 මාර්තු 09 දක්වාත් කටයුතු කර නොතිබුණි.

## 5.3 අයවැය පාලනය

(i) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන “යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශ,” චක්‍රලේඛයේ 5.1.3 ඡේදය අනුව, වාර්ෂික අයවැය ලේඛනය එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛනය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබුණේ 2014 පෙබරවාරි 19 දින දීය.

(ii) 2014 වර්ෂය සඳහා අයවැය ලේඛනය අවස්ථා 2 ක දී සංශෝධනය කර තිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පිළිවෙලින් 2014 මැයි 26 දින හා 2014 ඔක්තෝබර් 23 දින ලබාගෙන තිබුණි. තවද සංශෝධිත අයවැය සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

## 6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
(ආ) ලෙජර් ගිණුම් හා උපලේඛන පවත්වා ගැනීම
(ඇ) සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු හෙළිදරව් කිරීම
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) මාර්ග නඩත්තු කිරීම හා සේවාදායක වැඩ
(ඊ) ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය
(උ) මෝටර් වාහන උපයෝජනය
(ඌ) ඉඩම් උපයෝජනය
(එ) ඉන්වෙන්ට්‍රි පාලනය